# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1785/21 - 2012 නොවැම්බර් මස 21 වැනි බදාදා - 2012.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.94/47(III).

**(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2) (ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින්, මේ නියමය මගින් :-

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය "ගනේගොඩ කතරගම දේවාල පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) ''ගනේගොඩ කතරගම දේවාල පූජා භූමිය" වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,
නිවාස සහ පොදු පහසුකම් අමාත්‍ය.

කොළඹ දී ය.

*උපලේඛනය*

*ගනේගොඩ කතරගම දේවාල පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය*
*(මායිම් උපලේඛන 1හි කැබලි අංක 71)*

සර්වේයර් ජනරාල්ගේ 2010 මාර්තු මස 30 වැනි දින අංක Maha/DOL/2010/80 දරන සැලැස්මේ නිරූපිත මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 0.2441ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 112 සහ ජල මාර්ගය ; |
| නැගෙනහිරට | : | ක. සි. 320124 කලාප 4 පත්‍ර 1හි කැබලි අංක 35, 36, 37 ; |
| දකුණට | : | ක. සි. 320124 කලාප 4 පත්‍ර 1හි කැබලි අංක 37, 38 ; සහ |
| බස්නාහිරට | : | ක. සි. 320124 කලාප 4 පත්‍ර 1හි කැබලි අංක 38. |

12-112

1A - G 16911— 385 (2012/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.